# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023**
**2026 ජුනි**

**මානවශාස්ත්‍ර පීඨය**

**නාට්‍ය හා රංගකලාව**
**(අධ්‍යයන වර්ෂ 2010 සිට 2016 දක්වා)**

**නාට්‍ය නිර්මාණය හා විචාරය DMAT – E3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නාට්‍යයක කථාවින්‍යාසය (Plot) ගොඩනැංවීමේදී ආරම්භය, මධ්‍යය සහ අවසානය යන කොටස් තුනෙහි ඇති වැදගත්කම කුමක්ද? නිදසුන් ඇසුරින් පහදන්න.

02. නාට්‍ය පිටපතක් සජීවී වේදිකා නිර්මාණ කාර්යයක් බවට පරිවර්තනය කිරීමේදී නාට්‍ය අධ්‍යක්ෂවරයා සතු කාර්යභාරය සහ වගකීම් මොනවාදැයි විස්තර කරන්න.

03. කොන්ස්තන්තින් ස්ටැනිස්ලව්ස්කිගේ 'යථාර්ථවාදී රූපණ ක්‍රමවේදය' (The Stanislavski Method) සහ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ 'දුරස්ථීකරණ රූපණ ක්‍රමවේදය' (The Alienation Acting Method) අතර පවතින සිද්ධාන්තමය වෙනස්කම් මොනවාදැයි පැහැදිලි කරන්න.

04. නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලියකදී නිෂ්පාදන කළමනාකරු සහ වේදිකා කළමනාකරු සතු කාර්යභාරය සහ වගකීම් වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.

05. "රංගාලෝකකරණය යනු හුදෙක් වේදිකාව ආලෝකමත් කිරීම නොවන අතර නාට්‍යමය අර්ථකථනය උදෙසා ප්‍රබල දායකත්වයක් සපයනු ලබන අනුෂංගික කලා මාධ්‍යයකි." මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

06. පසුතල නිර්මාණ නාට්‍ය කෘතියක අර්ථකථනය තීව්‍ර කිරීමට හේතුවන ආකාරය, ඔබ දන්නා නාට්‍යමය උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

07. නාට්‍ය නිර්මාණයක රංගවස්ත්‍රාභරණ නිර්මාණ කාර්යයේදී අදාළ චරිත අයත් වන සමාජ ස්ථරය, වයස සහ මනෝභාවය තත්ත්වයන් නිරූපණය කිරීම සඳහා භාවිත කරනු ලබන තාක්ෂණික හා කලාත්මක උපක්‍රම මොනවාදැයි උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

08. ඔබ නරඹා ඇති වේදිකා නාට්‍යයක පසුතලය, රංගාලෝකකරණය සහ රංග වස්ත්‍රාභරණ යන දෘශ්‍ය මාධ්‍ය එකිනෙක සුසංයෝග වෙමින් නාට්‍යයේ තේමාව උද්දීපනය කිරීමට දායක වූ ආකාරය උදාහරණ දක්වමින් විග්‍රහ කරන්න.

*****************************